# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

# 1986 අංක 13 දරන
# ඉඩම් අත්කර ගැනීමේ
# (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1986 අප්‍රේල් මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1986 අප්‍රේල් මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල: ශත 30 යි

තැපැල් ගාස්තුව: ශත 75 යි

1986 අංක 13 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1986 අප්‍රේල් මස 22 වන දින]

එල්. ඩී.—ඕ. 52/84.

**ඉඩම් අත්කර ගැනීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1986 අංක 13 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. ඉඩම් අත්කර ගැනීමේ පනතේ 45 වන වගන්තියේ (3) වන උපවගන්තියේ " ඒ කොටස පිහිටා නොමැති නම් ඒ කොටසට ලැබිය හැකි වෙළඳ මිල විය යුතු ය " යන වචන වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 450 වන අධිකාරයේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම.

" ඒ කොටස පිහිටා නොමැති නම් ඒ කොටසට ලැබිය හැකි වෙළෙඳ මිල විය යුතු ය :

එසේ වුවද අත්කර ගැනීමේ නිලධරයා විසින්, මේ පනතේ කුමක් සඳහන් වුවද එම ඉඩම් කොටස සම්බන්ධයෙන් පහත දැක්වෙන ආකාරයෙන් වන්දි මුදල් ගෙවීම ඉදිරිපත් කර ගෙවීම කළ යුතු ය :—

(අ) එම කොටස සම්බන්ධයෙන් 17 වන වගන්තිය යටතේ ප්‍රදානයක් කිරීමේ දී එම ප්‍රදානය මගින් එම තැනැත්තන්ට වෙන් කරනු ලැබ ඇති එම වන්දි මුදල් ප්‍රමාණයේ අනුපාතයට, එම ප්‍රදානයට අනුව වන්දි මුදල් ලැබීමට හිමිකම් ඇති තැනැත්තන්ට—

(i) 1978 මාර්තු 31 දිනය ; හෝ

(ii) එම කොටස පිහිටා ඇති වීථි සීමා හෝ ගොඩනැගිලි සීමා නිශ්චය කරනු ලැබූ දිනය හෝ

යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ දී එම ඉඩම් කොටසේ වෙළෙඳ අගයට සමාන මුදලක් වහාම මුදලින් ගෙවනු ලැබිය යුතු අතර ;

(ආ) එම ඉඩම් කොටස සම්බන්ධයෙන් 7 වන වගන්තිය යටතේ දැන්වීමක් පළ කරනු ලැබුවේ යම් දිනයක ද එම දිනයේ දී එම ඉඩම් කොටසේ වෙළෙඳ අගය සහ (අ) ඡේදය යටතේ ගෙවනු ලැබූ මුදල් ප්‍රමාණය අතර වෙනස 17 වන වගන්තිය යටතේ දෙනු ලබන ප්‍රදානයට අනුව වන්දි ලැබීමට හිමිකම් ඇති තැනැත්තන්ට එම ප්‍රදානය මගින් එම තැනැත්තන්ට එම වන්දි මුදල් වෙන් කරනු ලැබ ඇති අනුපාතය අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන ආණ්ඩුවේ බැඳුම්කරවලට දැනට ගෙවනු ලබන පොලී අනුපාතිකය අනුව වූ පොලියක් ද සමග දස අවුරුද්දකට පසු මුදල් කරගත හැකි ආණ්ඩුවේ බැඳුම්කර යක් මගින් ගෙවනු ලැබිය යුතු ය. ".

ජ 089463—6,750 (86/03)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.